**<u>මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ</u>**

**<u>සහකාර - තාක්ෂණික අධි පන්තිය සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම</u>**

**<u>පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.</u>**

## 01.සම්බන්ධ වන ආයතන

| | යොමු අංකය | දිනය |
|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව: මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | මිප්‍ර /බඳ/පරි-අධි/කළ/තා.අධි | 2013.08.22 |
| 1.2 අමාත්‍යාංශය: සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය. | CIT/2/9/3/24 | 2013.09.17 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | DMS/C/06/05/16.<br>DMS/C /08/45/01<br>DMS/C6 /05/16-Vol –II | 2010.06.04 හා<br>2010.10.11<br>2012.11.09<br>2013.08.05 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | EST-2/RECRU/02/024 | 2012.05.31 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | NSCC/1/45/1/SR | 2012.06.21 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | PSC/EST/5/1/45/2/2012 | 2013.10.29 |

## 02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : - රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන , ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක /සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරින්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි .

3.4 කාර්යයන් පැවරීම :

මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යොෂ්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## 04.තනතුරේ ස්වභාව

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

## 05.වැටුප්

5.1 වැටුප් කේත අංකය: එම්. එන්-07-2006 A

5.2 වැටුප් පරිමාණය : 20030-11 X 365- 18 X 500-33045

5.2 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ ශ්‍රේණිය | පියවර 4 | 21125 |

## 06. සේවා ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව, හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක | 25 | • පඩි මිම් සහ කිරුම් මිනුම් උපකරණ සත්‍යායනය හා මුද්‍රා තැබීම.<br>• මුද්‍රා තැබීම මධ්‍යස්ථාන පැවැත්වීම පිළිබඳ කටයුතු.<br>• පඩි මිම් සහ කිරුම් මිණුම් උපකරණ නිෂ්පාදකයින්, අලුත්වැඩියා කරුවන් සහ වෙළඳුන් පරීක්ෂා කිරිම.<br>• පෙර ඇසුරුම් භාණ්ඩ පිළිබඳ පරීක්ෂා කිරිම හා අදාළ කටයුතු.<br>• ක්ෂෙත්‍රයේ වැටලීම /නඩු පැවරීම් /ගාස්තු අයකිරිම/ගාස්තු තැන්පත් කිරිම සම්බන්ධ කටයුතු .<br>• පාරිභෝගික අධ්‍යාපන කටයුතු<br>• ඉහත කටයුතු සම්බන්ධයෙන් පහළ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරිම.<br>• අයකරගත් ගාස්තු තැන්පත් කිරිම හා එම ගාස්තු පිළිබඳව ගණන් තැබීම.<br>• මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවහි ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරී . |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

| තනතුර | නිලධර සංඛ්‍යාව |
|---|---|
| මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක | 25 |

## 07.බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60%. |

(අ) ශ්‍රී ලංකා තාක්ෂණික සේවා ව්‍යවස්ථාවේ විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම යටතේ දැක්වෙන අනෙකුත් කොන්දේසි අදාළ වේ.

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

**7.3. සීමිත තරඟ විභාගය යටතේ උසස් කිරීමෙන් බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය - විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් - උසස් වීමේ ශ්‍රේණියක් බැවින් අදාල නොවේ.

7.3.2.2. වෘත්තිය සුදුසුකම් - අදාල නොවේ.

7.3.2.3 පළපුරුද්ද - අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක (05) ම උපයාගෙන තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් -

I උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

II I වන ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් ව තිබීම.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2. හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3. වයස - අදාල නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස්කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

7.3.4.1 ලිඛිත විභාගය

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 1 | 100 | 40% |
| කළමණාකරණය | පැය 3 | 100 | 40% |

(ඇමු ණුම 01)

7.3.4.1.1 විභාගය පවත්වන බලධරයා - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අදාල නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - අභ්‍යන්තරව පළකරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාළ කර ගතයුතු වන්නේ එම විභාගය අදාළ වන්නාවූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

i. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට නොහැකි වූයේ නම් ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල එක් එක් වර්ෂ වල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාළ කර ගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂ වල පුරප්පාඩු ඇතිවූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධාරීන් ලකුණු අනුපිළිවෙල අනුව තෝරාගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත් වූ දිනය වේ.

7.4. සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත උසස් කිරීමෙන් බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය - විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් - අදාළ නොවේ.

7.4.2.2. වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය(06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් - i. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii .අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. Iවන ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2 හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස - අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙළ මත සහ පවතින පුරපපාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

7.4.4.1 ලිඛිත විභාගය - අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ.

7.4 .4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| <u>සේවා පළපුරුද්ද</u><br>අදාළ සක්‍රීය සේවා කාලය ඉක්මවා ලබා ඇති පළපුරුද්ද | 50 | අදාළ නොවේ. |
| කුසලතාවය | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන

බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේ දී ඉහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ විස්තරාත්මක ලකුණු පරිපාටිය සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

7.4.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තරව දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්** - අදාල නොවේ.

**09. භාෂා ප්‍රවීණතාව** - අදාල නොවේ

**10. ශ්‍රේණි උසස් කිරීම** - අදාල නොවේ

**11. තනතුරු වලට පත්කිරීම** : අදාල නොවේ

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:**

“සක්‍රීය සේවා කාලය” යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය
ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වේ.

15. සෑම පත්වීමක්ම සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ

(අත්සන) ........... 2013.12.31

නම: ලෝචනා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව
101, උද්‍යාන පාර, කොළඹ 05.

දිනය :

පරීක්ෂා කළේ

(අත්සන) ...........

නම: ආර්.ඩී. එම්. අලංකා
සහකාර අධ්‍යක්ෂ

තනතුර: මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
101. උද්‍යාන පාර - කොළඹ - 05

දිනය : 2013. 12. 31

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ........කේ. ප්‍රේමසිරි කුමාර
වැඩ බලන අධ්‍යක්ෂ

නිලමුද්‍රාව: මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
අංක 101, උද්‍යාන පාර - කොළඹ-05

දිනය: 2013-12-31

යොමු අංකය : CA/7/2/9/3/24

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධි පන්තිය සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : (signature)

නම :

ලේකම්
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

දිනය: 2014.01.11

නිලමුද්‍රාව:
ජී. කේ. ඩී. අමරවර්ධන
ලේකම්,
සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය
සතොස මහ ලේකම් කාර්යාලය,
නො. 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

---

යොමුඅංකය : PSC/EST/5/1/45/2/2012

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධි පන්තිය සේවා ගණයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013.10.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : (signature)

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2014/03/24

නිලමුද්‍රාව:
ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

1 විභාගයේ නම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

02 විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණයකි

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 1 | 100 | 40% |
| 2. | කළමනාකරණය | පැය 3 | 100 | 40% |

03.විභාගය පවත්වන බලධරයා : රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග-

අවශ්‍යතාවය පරිදි වසරකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම ,කුසලතා හා ආකල්ප අත්පත්කර ගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |
| කළමනාකරණය | 1. කළමනාකරණ මූලධර්ම<br>2. කළමනාකරණ ශ්‍රිතයන්<br>සැලසුම්කිරීම<br>තීරණ ගැනීම<br>තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>සංවිධානය<br>මාණ්ඩලීකරණය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>නායකත්වය<br>පාලනය<br>පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br><br>3 .සහභාගිත්ව කළමනාකරණය<br>4.කළමනාකරණ පරිසරය<br>5.සිද්ධි අධ්‍යයනය |

සකස්කලේ

අත්සන :
ලෝචනා බාලසූරිය

නම : සහකාර අධ්‍යක්ෂ (පාලන)

තනතුර : මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව

දිනය : 101, උද්‍යාන පාර, කොළඹ 05.

2013- 12- 31

පරික්ෂා කලේ

අත්සන : ආර්. ඒ. එම්. අලංකා

නම : සහකාර අධ්‍යක්ෂ

තනතුර : මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
101, උද්‍යාන පාර - කොළඹ - 05

දිනය : 2013. 12. 31

අත්සන :

( දෙපාර්තමේන්තු ප්‍රධානියා) කේ. ප්‍රේමසිරි කුමාර
වැඩ බලන අධ්‍යක්ෂ

නම : මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

තනතුර : අංක 101, උද්‍යාන පාර - කොළඹ-05

දිනය : 2013-12-31

නිල මුද්‍රාව :